(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 3(2)]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2009 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා**

## 2009 මැයි මස 19 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0347/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ නව රජය බලයට පත්වීමෙන් පසු අදාළ නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් මේ දක්වා විදේශ සංචාරය කළ රටවල් කවරේද;

(ii) එතුමා විසින් කරන ලද නිල හා පෞද්ගලික විදේශ සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාර සඳහා එතුමා සමඟ සහභාගී වූ නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල නිලධාරීන් සහභාගි වූයේ නම් ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එතුමා ඇතුලු අනෙකුත් නිලධාරීන් විදේශගත වූ ගුවන් සමාගම හා ගුවන් පන්තිය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම විදේශ සංචාර වලින් මෙරටට ලැබුණු විදේශ ආධාර, විදේශ ණය, ව්‍යාපෘති හෝ වෙනත් ප්‍රතිලාභයන් කවරේද යන්න එක් එක් සංචාරයට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 16 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 16 දරන නියමය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 25003 " විවිධ අත්තිකාරම් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 20,00,00,000 සිට<br>රු. 21,00,00,000 දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 75,00,00,000 සිට<br>රු. 48,00,00,000 දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 70,00,00,000 සිට<br>රු. 74,60,00,000 දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2009.03.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 17 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 17 දරන නියමය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 28502 " කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 26,50,00,000 සිට<br>රු. 19,00,00,000 දක්වා |

| | | |
|---|---|---|
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2009.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 19 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 19 දරන නියමය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 “ රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 20,00,00,000<br>26,00,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.<br>රු. | 3,00,00,000<br>4,00,00,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2009.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 20 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 20 දරන නියමය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 " රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 10,00,00,000 සිට රු. 11,00,00,000 දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2009.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 21 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 21 දරන නියමය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 25002 " වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා වූ අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 53,00,000<br>52,50,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2009.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛණයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

උපලේඛණය

**2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය**

2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2008 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛණය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | විෂය අංකය | ii රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමා | | iii රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | iv රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| 1 | ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යවරයා | 16601 | - | - | - | - | 10,000,000 | 20,000,000 | 1 |
| 2 | නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා | 12501 | - | - | - | - | 15,000,000 | 54,000,000 | 4 |
| 3 | දේශීය වෛද්‍ය අමාත්‍යවරයා | 13801 | - | - | 4,000,000 | 1,100,000 | - | - | 5 |
| 4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | 25801 | - | - | - | - | 75,000,000 | 135,000,000 | 7 |
| 5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය | 27401 | - | - | 30,000,000 | 20,000,000 | - | - | 8 |
| 6 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යවරයා | 15101 | - | - | - | - | 5,000,000 | 5,600,000 | 9 |
| 7 | ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යවරයා | 13601 | - | - | 4,000,000 | 2,350,000 | - | - | 10 |
| 8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 27001 | - | - | 28,000,000 | 26,000,000 | 65,000,000 | 147,000,000 | 11 |
| 9 | වෙළෙඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 24401 | - | - | - | - | 10,000,000 | 13,000,000 | 13 |
| 10 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | - | - | 180,000,000 | 170,000,000 | 220,000,000 | 600,000,000 | 14 |
| 11 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | - | - | 702,000,000 | 650,000,000 | - | - | 15 |
| 12 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය | 01901 | - | - | 250,000 | 239,231 | - | - | 18 |

(මෙම නියමයන් වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2009.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත යටතේ නියමය,— 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 1 වැනි වගන්තිය හා 66 (4) වැනි වගන්තිය යටතේ වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 අප්‍රේල් මස 17 දිනැති අංක 1597/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.05.06 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජනවාරි මස 30 දිනැති අංක 1586/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.05.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 පෙබරවාරි මස 20 දිනැති අංක 1589/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.05.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
## (2009 මැයි මස 19 වැනි අඟහරුවාදා)

0952/'08

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ අංක 10/10/2525/2004 (05) හා 2005.09.30 දිනැති ලිපියෙන් ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ III ශ්‍රේණියේ "අ" ඛණ්ඩයේ තනතුරුවලට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා 2005.10.12 සිට 2005.10.14 දින දක්වා තැපැල් මූලස්ථානයට කැඳවන ලද ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ III ශ්‍රේණියේ "ආ" ඛණ්ඩයේ ප්‍රධාන තැපැල් ස්ථානාධිපති, පාලන සහකාර, තැපැල් කාර්යාල විමර්ශන පරීක්ෂක හා තැපැල් කාර්යාල ගිණුම් පරීක්ෂකවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ගේ නම්, තනතුරු හා රාජකාරී ලිපිනයන් කවරේද;

(ii) ඉහත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අය අතුරින් 2007.07.31 වැනි දිනට ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ III ශ්‍රේණියේ "අ" ඛණ්ඩයට උසස්වීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම නිලධාරීන්ගේ නම්, තනතුරු, උසස්වීම් ප්‍රදානය කළ දිනයන් හා රාජකාරී ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1169/'08

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ අංක 10/10/අIIIඅ/03/06 හා 2006.02.27 දිනැති ලිපියෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමතියට යටත්ව, තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමතිය මත, 2006.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ III ශ්‍රේණියේ "අ" ඛණ්ඩයේ පුරප්පාඩු තනතුරුවල පූර්ණකාලීනව වැඩ බැලීමට පත්කළ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ගේ නම්, තනතුරු හා රාජකාරී ලිපිනයන් කවරේද;

(ii) ඉහත නිලධාරීන්ගෙන් 2007.03.31 වැනි දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම ගන්වා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම්, පුද්ගලික ලිපිනයන් හා විශ්‍රාම ගන්නා විට දැරූ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත (අ) අනුව, පූර්ණකාලීනව වැඩ බැලීමට පත්කළ පුත්තලම, බදුල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන් ලෙස රාජකාරී කළ ජී. ගොඩගේ , කේ. ජී. ගමගේ සහ ආර්. ඒ. කොට්ටහච්චි යන මහත්වරුන් පිළිවෙලින් 2006.08.22, 2006.12.21 සහ 2007.02.09 දිනයන්හි වයස අවුරුදු 60 සම්පූර්ණවීම නිසා විශ්‍රාම ගැන්වූ හෙයින් දශක හතරකට නොඅඩු සේවා කාලයක් ඇති මෙම නිලධාරීන් තිදෙනාගේ වැඩ බලන තනතුරු ස්ථිර කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1172/'09

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල උඩුගම අධ්‍යාපන කලාපයේ පාසැල් අතුරින් 2008 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට ළමයින් ඉදිරිපත් වූ පාසැල් කවරේද;

(ii) එම එක් එක් පාසැලෙන් ඉදිරිපත් වූ ළමයින් සංඛ්‍යාව, ඒ අතුරින් සමත් වූ සංඛ්‍යාව සහ සමත් වූ ප්‍රතිශතයන් කවරේද;

(iii) 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා එම පාසල්වලින් උසස් පෙළ විභාගය සමත් වූ ප්‍රතිශතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාපයේ පාසැල් අතුරින් 2008 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට ළමයින් ඉදිරිපත් වූ පාසැල් කවරේද;

(ii) එම එක් එක් පාසැලෙන් සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත් වූ සංඛ්‍යාව, සමත් වූ සංඛ්‍යාව සහ සමත් වූ ප්‍රතිශතය කවරේද;

(iii) 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා එම පාසැල්වලින් සාමාන්‍ය පෙළ විභාගය සමත් වූ ප්‍රතිශතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමස්තයක් ලෙස ඉහත අධ්‍යාපන කලාපය තුළ පාසැල්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සහ (සාමාන්‍ය පෙළ) අධ්‍යාපන මට්ටමේ සංවර්ධනය ක්‍රමානුකූලව අඩුවී තිබේද, නොඑසේනම් වැඩි වී තිබේද;

(ii) අධ්‍යාපන මට්ටමේ අඩුවීමක් තිබේනම් එම තත්වය වෙනස් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1174/'09

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල - උඩුගම මාර්ගය ඉතාම පැරණි උප මාර්ගයක් බවත්;

(ii) මේ වන විට අදියර කිහිපයක් යටතේ ගාල්ල සිට තලංගහ දක්වා සංවර්ධනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ මගී බස්රථ ඇතුළු වාහන විශාල ප්‍රමාණයක් දිනපතා ධාවනය වන බවත්;

(ii) මෙම මාර්ගයේ තලංගහ සිට බාර් හන්දිය දක්වා අධික වංගු සහිත අබලන් වූ පටු මාර්ගයක් වන බැවින් මෙහි ගමන්ගන්නා වාහන අනතුරු වලට ලක්වීමේ අවදානම වැඩි බවත්;

(iii) එසේම අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවන බවත්;

(iv) පසුගිය කාලයේ දී උඩුගම - නෙලුව මාර්ගය හා උඩුගම අම්බලම හරහා යටලමත්ත ඇතුළු මාර්ගද සංවර්ධනය කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) තලංගහ සිට බාර්හන්දිය දක්වා කොටසේ පමණක් මාර්ගය පුළුල්කර, බෝක්කු සකස්කර, සංවර්ධනය නොකිරීමට හේතුව කවරේද;

(ii) මාර්ගයේ ඉහත කොටස සංවර්ධනය කිරීම කවර ව්‍යාපෘතියක් යටතේ කොපමණ කාලයක් තුළ සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1201/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කැකිරාව, ඉපලෝගම රණවිරු ගම්මානය ඉදිකිරීම ආරම්භ කරන ලද්දේ කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානයේ සම්පූර්ණ බිම් ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමියේ ඉදිකිරීමට නියමිතව ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එක නිවසක් ඉදිකිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) මෙම ගම්මානයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(v) වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ගම්මානයේ අතුරු මාර්ග හා කාණු පද්ධතිය සැකසීම සඳහා වැයවී ඇති මුදල කොපමණද;

(ii) සම්පූර්ණ වර්ග ප්‍රමාණයෙන් නිවාස හා මාර්ග පද්ධතිය ඉදිකිරීම සඳහා යොදාගෙන ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ගම්මානයේ සම්පූර්ණ බිම් ප්‍රමාණයෙන් කොපමණ ප්‍රමාණයක් නිරාවරණය වී තිබේද;

(iv) මෙම නිවාස කවර පදනමක් යටතේ රණවිරුවන් වෙත ලබාදෙන්නේද;

(v) එක් නිවසක් වෙනුවෙන් කොපමණ මුදලක් අයකිරීමට බලාපොරොත්තු වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1212/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මගනැගුම ව්‍යාපෘතිය සඳහා 2006, 2007 සහ 2008 වර්ෂ තුළ අනුරාධපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් කොපමණ මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලද්දේද;

(ii) එම එක් එක් වර්ෂය තුළදී වෙන්කළ මුදලින් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඒ ඒ ප්‍රාදේශීය සභා හෝ මහ නගර සභා පාලනයට යටත් මාර්ගයන්හි දුර ප්‍රමාණ කොපමණද;

(ii) එම එක් එක් ප්‍රාදේශීය බල ප්‍රදේශයේ මෙම ව්‍යාපෘතිය යටතේ තාර දමා හෝ කොන්ක්‍රීට් අතුරා ඇති දුර ප්‍රමාණය හා බොරළු දැමූ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතිය යටතේ තාර දැමූ හෝ කොන්ක්‍රීට් අතුරා ඇති දුර ප්‍රමාණය, සම්පූර්ණ දුර ප්‍රමාණයෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1219/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලෝක වෙළඳපොළේ බොරතෙල් බැරලයේ මිල අඩුවෙමින් පවතින්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලෝක වෙළඳපොළේ බොරතෙල් බැරලයක වර්තමාන මිල කොපමණද;

(ii) විදේශ නැව්වලට හා විදේශ ධීවර නැව්වලට ඩීසල් අලෙවි කරන මිල කොපමණද;

(iii) මෙරට ධීවර කාර්මිකයනට ඩීසල් හා පෙට්‍රල් ලබා දෙන මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1224/'09

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "අපි වවමු - රට නගමු" ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන එක් එක් දිස්ත්‍රික්කය සඳහා 2007, 2008 වර්ෂයන්හිදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය හා ඒ අතුරින් වැයකළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) "අපි වවමු - රට නගමු" ව්‍යාපෘතියට අදාළ ජාතික උත්සව සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් සවිස්තරව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) "අපි වවමු - රට නගමු" ව්‍යාපෘතියට අදාළව නව නිලධාරීන් හෝ කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ලිපිනයන්, තනතුරු, වැටුප හා ඔවුන්ට ලබාදී ඇති වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ගාල්ල නගරය තුළ ක්‍රියාත්මක වූ "ගාලු සමය" වැඩසටහන සඳහා "අපි වවමු - රට නගමු" ව්‍යාපෘතියෙන් හෝ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම මුදල සහ එම මුදල් වියදම් කළේ කවර කාර්යයක් සඳහාද;

යන්න සවිස්තරව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1225/'09

ගරු අජිත් කුමාර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 10 ක් තුළ කුරුඳු කිලෝග්‍රෑමයක් සඳහා දේශීය වශයෙන් ලද මිල හා විදේශ වෙළෙඳපොළේදී ලද මිල, ඒ ඒ කුරුඳු වර්ග සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දේශීය වශයෙන් කුරුඳු මිලදී ගැනීමේදී මිල තීරණය කරන්නේ කවර ක්‍රමවේදයකට අනුවද;

(iii) ශ්‍රී ලංකා රජය විසින් දේශීය කුරුඳු නිෂ්පාදනය මිලදී ගෙන අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආයතනයක් විසින් කවර ප්‍රමාණයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 10 තුළ කුරුඳු අපනයනය කරන ලද රටවල් කවරේද;

(ii) ඒ කවර ප්‍රමාණයක්ද;

(iii) කුරුඳු අපනයනය කළ පුද්ගලයන් හෝ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අපනයනකරුවන්ට හා කුරුඳු ක්ෂේත්‍රයේ වෙනත් ව්‍යාපාරිකයන්ට රජය මඟින් ලබාදෙන සහන කවරේද;

(ii) කුරුඳු ආශ්‍රිතව අගය වැඩිකළ නිෂ්පාදන සඳහා රජය විසින් ගනුලැබූ ක්‍රියාමාර්ග හා එම නිෂ්පාදනයන් කවරේද;

(iii) එමඟින් ලැබෙන ආදායම හා රජය විසින් ඒ සඳහා ලබාදෙන සහනාධාර කවරේද;

(iv) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1226/'09

ගරු අජිත් කුමාර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 සිට 2008 වර්ෂය දක්වා කාලය තුළ මෙරට නිෂ්පාදනය කරන ලද කුරුඳු හා අනෙකුත් සුළු අපනයන භෝග ප්‍රමාණය කොපමණද;

(ii) එම නිෂ්පාදනයන් අතුරින් අපනයන කළ ප්‍රමාණය කොපමණද;

(iii) එමඟින් ලද අපනයනය ආදායම කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාලය තුළදී වගාකරුවන්ට පොහොර සහනාධාරය ලබා දුන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණද;

(iii) එසේ ලබා නොදුන්නේ නම්, ඊට හේතු කවරේද;

(iv) කුරුඳු නැවත වගාවට සහ කුරුඳු අලුතින් වගා කිරීමට රජය මඟින් දෙනු ලබන සහන කවරේද;

(v) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(vi) ඉහත කාලය තුළ කුරුඳු නිෂ්පාදන සඳහා ලබාදුන් වෙනත් සහන හා ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2009 වර්ෂය වෙනුවෙන් කුරුඳු සඳහා රජයේ සහන පැකේජය මඟින් ලබාදීමට නියමිත සහන කවරේද;

(ii) මේ වනවිට එම සහන ලබාදී තිබේද;

(iii) ඒ සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 21 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1213/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජලභීතිකා රෝගය සඳහා රෝගීන් කොපමණ සංඛ්‍යාවක් 2005, 2006, 2007 සහ 2008 වර්ෂ තුළ රෝහල් වලින් ප්‍රතිකාර ලබාගෙන තිබේද;

(ii) එම අයට ප්‍රතිකාර කිරීම සඳහා කොපමණ ජලභීතිකා එන්නත් ප්‍රමාණයක් ආනයනය කරන ලද්දේද;

(iii) ඒ සඳහා වාර්ෂිකව වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජලභීතිකා රෝගය මර්දනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒ සඳහා වාර්ෂිකව වෙන්කරන ලද හා වැයකර ඇති මුදල කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුළ මිය ගොස් ඇති ජලභීතිකා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1214/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රණවිරු ලොතරැයිය කවර වර්ෂයක ආරම්භ කරන ලද්දේද;

(ii) ආරම්භක වර්ෂයේ සිට 2008 වර්ෂයේ අවසානය දක්වා ලොතරැයි අලෙවියෙන් වාර්ෂිකව උපයාගත් මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රණවිරු ලොතරැයි ටිකට්පත් අලෙවියෙන් ලද ආදායමින් කොපමණ මුදලක් එක් එක් වර්ෂයේ රණවිරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ලබා දී තිබේද;

(ii) එම එක් එක් වර්ෂයේ උපයාගත් ආදායමින් කවර ප්‍රතිශතයක් ඒ ඒ කටයුතු සඳහා වෙන් කළේද;

(iii) රණවිරු සුභසාධනය වෙනුවෙන් වෙන් කළ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1216/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මොරගහකන්ද ජලාශය ඉදිකිරීම කවර වර්ෂයක ආරම්භ කරන ලද්දේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භකර තිබේනම්, 2006, 2007 සහ 2008 වර්ෂ සඳහා වාර්ෂිකව වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) එසේ වාර්ෂිකව වෙන්කළ ප්‍රතිපාදනවලින් කොපමණ මුදලක් ඒ ඒ වර්ෂය තුළ වැයකර තිබේද;

(v) ඇස්තමේන්තුගත මුදලින් ඉහත එක් එක් වර්ෂය තුළ අදාළ ව්‍යාපෘතිය සඳහා නොලැබී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කෙදිනක අවසන් කිරීමට බලාපොරොත්තු වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1227/'09

ගරු අජිත් කුමාර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දිස්ත්‍රික් කාර්යාල යටතේ තිබෙන ව්‍යාප්ති කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන භෝග වර්ග කවරේද;

(iv) වගා ව්‍යාප්ති කටයුතු සඳහා සිටින ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(v) ඒ අතුරින් කුරුඳු වගාව ව්‍යාප්ත කිරීම සඳහා සිටින ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(vi) මෙම ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාවෙහි වෙන් වෙන් වශයෙන් කොපමණ හිඟයක් පවතීද;

(vii) 2008 වර්ෂයේදී අදාළ ව්‍යාප්ති නිලධාරීන් බඳවා ගැනීමට ගැසට් නිවේදනයක් පළ කරනු ලැබුවේද;

(viii) එම බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දෙපාර්තමේන්තුවට බඳවා ගෙන ඇති අතිරේක ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් හා සේවා කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම පිරිස ස්ථිරව බඳවා ගැනීමට කොපමණ කාලයක් ගතවේද;

(iv) 2005 වර්ෂයේදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බඳවාගත් උපාධිධාරීන් සඳහා නිශ්චිත වගකීමක් සහ රාජකාරී ලැයිස්තුවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1233/'09

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගා/නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනාරක්ෂිත ස්ථානවල පදිංචිව සිටි අයගේ නිවාස 2003 ගංවතුරින් විනාශ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන් අතුරින් කොපමණ සංඛ්‍යාවකට තල්ගස්වල වතුයායෙන් ඉඩම් ලබාදී තිබේද;

(ii) එසේ වන්දි ලබාදීමට නියමිතව ඇති අයට ගෙවීමට ඇති හිඟ වන්දි ප්‍රමාණය කොපමණද;

(iii) එම අයට නිවාස සාදාගැනීම සඳහා අනුමතවූ හිඟ වන්දි මුදල් කොපමණ කාලසීමාවක් තුළ ලබාදෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත අනාරක්ෂිත ස්ථානවලම නිවාස තිබී ඒවා විනාශ වුවද, අනුමතවූ ඉඩම් නොලැබීම නිසා අනාරක්ෂිත ස්ථානවල තම නිවාස නැවත සකස්කරගත් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) එම අයට නිර්වන්දි ගිවිසුමක් යටතේ ඉදිරි ආපදාවකදී වන්දි ගෙවීමට හැකි බවට නාගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට දන්වා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේනම් ඉදිරි ආපදාවකදී නොව 2003 වර්ෂයේදී නිවාස විනාශ වීමෙන් වන්දි ගෙවීමට අනුමතවී එහෙත් ඉහත අනාරක්ෂිත ස්ථානවලම නිවාස සාදාගෙන සිටින අයට අනුමත හිඟ වන්දි මුදල කොපමණ කාලසීමාවක් තුළ ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1234/'09

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2000 වර්ෂයේ සිට 2008 දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික නිමි තේ නිෂ්පාදනය හා ඒ අතුරින් අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑම් ප්‍රමාණය අදාළ රටවල් ද සමඟ කවරේද;

(ii) තේ අපනයනයෙන් අප රට ලැබූ ආදායම කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ තේ ප්‍රමාණ සහ එම රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තේ ආනයනයට වැයකළ සම්පූර්ණ මුදල වාර්ෂිකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වෙනත් රටවල් විසින් අප රටෙන් තේ ඇණවුම් කරන විට එම ඉල්ලුම්කරුවන් වෙනත් රටවල තේ ද (උදාහරණ: ඇසෑම් තේ) ඇණවුම් කරන බවට අදාළ උපදේශක කාරක සභා රැස්වීමේදී නිලධාරීන් දන්වා සිටි බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ ඇණවුම් කරන ලද විදේශ රටවල තේ ප්‍රමාණයන් සහ තේ වර්ග අදාළ රටවල්ද සමගින් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) ඉහත ඇණවුම්වල පිටපත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඊ) ශ්‍රී ලංකාවේ ඉතා හොඳ තත්වයේ තේ නිපදවද්දී, තේ ආනයනය කර ශ්‍රී ලංකා තේ සමග මිශ්‍රකර අපනයනය කිරීමෙන් අපේ තේ අපනයනයට ප්‍රබල හානියක් සිදුවන බැවින් තේ ආනයනය නතර කිරීමට එතුමා කඩිනම් පියවර ගන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද ?

1237/'09

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කඳාන, හපුගොඩ අංක 265 දරන නිවසේ පදිංචිව සිටි ඩොල්පින් එස්නර් වෙන්සියුලස් ෆර්ඩිනැන්ඩ්ස් මහත්මිය විශ්‍රාම වැටුප් ලබමින් සිට 2002.12.24 දින මියගිය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැන්දඹුවට හිමි විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ලබා සිටියේ ආබාධිත පී. ඒ. රේපියල් ෆර්ඩිනැන්ඩ්ස් යන අය බවත්;

(ii) එසේ හිමිකම් ලබමින් සිටියදී, 2003 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට විශ්‍රාම වැටුප නතර කළ බවත්;

(iii) වැන්දඹු අනත්දරු අංක 38917 යටතේ ෆර්ඩිනැන්ඩ්ස් මහත්මියගේ නොගෙවන ලද ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාසවල විශ්‍රාම වැටුප් වවුචර් අංක 3522, 9524 සහ 4624 යටතේ පිළිවෙලින් 2003.01.03, 2003.02.22 සහ 2003.03.24 යන දිනවලදී කඳාන තැපැල් කාර්යාලය මගින් ජාඇල ප්‍රදේශීය ලේකම් කාර්යාලයට ආපසු යවා ඇති බවත්;

(iv) ජා ඇල ප්‍රාදේශීය ලේකම් විසින් පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාව අනුව භාරකරු වශයෙන් බර්නා එලිසබෙත් ෆර්ඩිනැන්ඩ්ස් මහත්මිය නිර්දේශ කරමින් අවශ්‍ය විස්තර සහිත පිටු අංක 1-52 දක්වා ඇතුළත් අංක 82/110443 දරන ලිපිගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හා ගණකාධිකාරී වෙත යවා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධව පරීක්ෂාකර 2003.02.01 දින සිට 2004.10.01 දින දක්වා හිඟ විශ්‍රාම වැටුප් ප්‍රමාණය ගණනය කර අදාළ අයට හිමි විශ්‍රාම වැටුප් නොපමාව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 22 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1166/'08

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සීමාසහිත රාජ්‍ය වාණිජ සමූපකාර තොග වෙළෙඳ සමාගම ආරම්භ කිරීමට අදහස් කළ දිනය කවරේද;

(ii) එය සත්‍ය වශයෙන්ම ආරම්භ කළ දිනය කවරේද;

(iii) සමාගමේ ප්‍රාග්ධන ප්‍රමාණය සමග අධ්‍යක්ෂවරුන්ගේ සහ කොටස් හිමියන්ගේ නම් කවරේද;

(iv) එය සංස්ථාපිත කළ දිනයේ සිට අද දක්වා සිදුකළ සියලු ආනයන කවරේද;

(v) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(vi) එසේ නම්, අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද ටෙන්ඩර් මණ්ඩලයේ අවසන් නිර්දේශ සමඟ ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(vii) මාසික පදනමින් මේ දක්වා සමාගමේ මුළු පිරිවැටුම හා ලාභ ප්‍රමාණයන් කවරේද;

(viii) ලාභය හා පිරිවැටුම් අනුපාතය කවරේද;

(ix) සීමාසහිත රාජ්‍ය වාණිජ සමූපකාර තොග වෙළෙඳ සමාගමට හිමි වෙළෙඳ පොළ කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාරිභෝගික අලෙවිසල් ලෙස දිස්ත්‍රික් පදනමින් රට තුළ ලියාපදිංචි කර ඇති වෙළෙඳසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1167/'08

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නාගරික සංවර්ධන අධිකාරිය (UDA) හෝ ආයෝජන මණ්ඩලය (BOI) හෝ කඩුවෙල පිහිටි රජයේ ආයතන විසින් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති යටතේ මහල් 70ක් හා කාර්යාල හා වාණිජ කටයුතු සඳහා පමණක් වන මහල් 40 ක් ඉදිකිරීම සඳහා එළඹෙන ලද ගිවිසුමක් තිබුණේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ගිවිසුමට එළඹෙන ලද්දේ කවුරුන් සමගද;

(ii) එම ගිවිසුමට එළඹෙන ලද්දේ "SUCHIR" ප්‍රොපටි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සමගද;

(iii) මෙම සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ නම් කවරේද;

(iv) නොඑසේ නම්, අධ්‍යක්ෂවරුන්ගේ නම්ද සමග සමාගමේ නම කවරේද;

(v) ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය, ලබාදී ඇති මිල, ලබාදී ඇති කාලසීමාව සහ රජයේ තක්සේරු කවරේද;

(vi) වටිනාකම තීරණය කරන ලද්දේ කෙසේද;

(vii) මෙය සිදුකරන ලද්දේ ටෙන්ඩර් කැඳවීම මගින් ද එසේත් නැතිනම් සිය කැමැත්තෙන් ඉදිරිපත් කරන ලද යෝජනා අනුවද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිකිරීමට අදහස් කර ඇති මෙම සුවිශේෂී ගොඩනැගිල්ල වෙනුවෙන් රජයේ බැඳීමක් ඇති කරන මුදල් හෝ වෙනත් කවර හෝ ආයෝජන ආකාරයෙන් වූ රජයේ වගකීම්, ඇප, බදු විරාම ආදිය කවරේද;

(ii) එය ඉදිකර අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1217/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දේශීය වශයෙන් මෙරට මත්පැන් නිෂ්පාදනය කරන්නේද;

(ii) එසේනම්, 2005, 2006, 2007, 2008 යන වර්ෂවල නිෂ්පාදනය කරන ලද මත්පැන් ලීටර් සංඛ්‍යාව කොපමණද;

(iii) කවර ආයතනයක් විසින් වාර්ෂිකව කොපමණ ප්‍රමාණයක් මත්පැන් නිෂ්පාදනය කරන ලද්දේද;

(iv) එම එක් එක් ආයතනය විසින් වාර්ෂිකව රජයට ගෙවා ඇති බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුළ මත්පැන් නිෂ්පාදනය වැඩිවී හෝ අඩුවී තිබේද;

(ii) එම අඩුවීම හෝ වැඩිවීම 2005 වර්ෂයට සාපේක්ෂව කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1218/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරටට මත්පැන් ආනයනය කරන්නේද;

(ii) එසේනම්, 2005, 2006, 2007 සහ 2008 වර්ෂවල ආනයනය කරන ලද මත්පැන් ලීටර් සංඛ්‍යාව කොපමණද;

(iii) එම මත්පැන් ආනයනය සඳහා වාර්ෂිකව වැයකළ මුදල කොපමණද;

(iv) ආනයනික මත්පැන් වලින් ලැබූ වාර්ෂික බදු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත්පැන් ආනයනය 2005 වර්ෂයට සාපේක්ෂව 2006, 2007 සහ 2008 වර්ෂවල අඩුවී හෝ වැඩිවී තිබේද;

(ii) එම අඩුවීම හෝ වැඩිවීම කවර ප්‍රතිශතයකින් සිදු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1053/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහගල්ල, පල්ලේකැලේ භූමිය තුළ පිහිටි "ඉරුදෙණියාය උස්බිම් සංවර්ධන යෝජනා ක්‍රමය" නම් ජනපදය තුළ වර්ෂ 40 කට අධික කාලයක සිට ජනතාව පදිංචිව සිටින බව එතුමා දන්නෙහි ද?

(ආ) (i) එහි භූමි ප්‍රමාණය සහ පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් ඡන්ද හිමි නාමලේඛනයේ ඇතුළත් වන්නේද;

(iii) එහි ග්‍රාම නිලධාරි, සමෘද්ධි නිලධාරි, කෘෂිකර්ම නිෂ්පාදන හා පර්යේෂණ නිලධාරීන් රජයේ පත්වීම් ලබා සේවය කරන්නේ නම්, ඒ කවුරුන්ද;

(iv) එහි රජයේ පාසල් තිබේ නම්, එම සංඛ්‍යාව හා ඒ කවරේද;

(v) සමූපකාරයක් හා සායන මධ්‍යස්ථානයක් තිබේ නම්, ඒ කවරේද;

(vi) රජය මගින් පාලම්, බෝක්කු සහ මංමාවත් තනා තිබේ නම්, එම සංඛ්‍යාව හා ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) (i) ඉහත ජනපදය තුළ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බස් රථ හා පුද්ගලික බස්රථ ධාවනය වන බවත්;

(ii) පදිංචිකරුවන්ට රජයේ බැංකු මගින් ගොවි ණය/වගා ණය ලබා දී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) හිටපු ජනාධිපතිවරයෙකු විසින් 1994.03.23 දින "ඉරුදෙණිය උස්බිම් සංවර්ධන යෝජනා ක්‍රමය" සංවර්ධනය කර විවෘත කළ බවත්;

(ii) හිටපු පරිසර නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ උපදෙස් පරිදි මෙම ඉඩම් බෙදාදීම පිළිබඳව පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමීක්ෂණයක් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ඉ) ඉහත භූමියේ පදිංචිව සිටින ජනතාව වෙත එම ඉඩම් නිදහස් කිරීමට එතුමා පියවර ගන්නෙහි ද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1086/'08

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහියංගන නගරයේ රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මහියංගන නගරයේ ඉඩම් කට්ටි දැනට පෞද්ගලික අංශයට ලබා දීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම් එම ඉඩම් කට්ටි ලබාදීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත ඉඩම් ලබාගත් අයගේ විස්තර එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහි ද?

(ඈ) (i) එකී ඉඩම් ඉදිරියේදී පෞද්ගලික අංශයට ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ඉදිරි කාලයේදී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් සඳහා මහියංගන නගරයේ වෙන් කර ඇති ඉඩම් කට්ටි කවරේද;

(iii) ඒවායේ ප්‍රමාණයන් හා අදාළ ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) (i) රජයේ කාර්යාල සහ නිල නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් වෙන්කර නොමැති නම් ඊට හේතුව කවරේද;

(ii) අවශ්‍ය ඉඩම් වෙන් කරනු ලබන්නේ කවර ප්‍රදේශයකින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1124/'08

ගරු විජිත රණවීර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාර්ග නඩත්තු භාර අරමුදල පිහිටවනු ලැබුවේ කවදා සිටද;

(ii) එහි නීතිමය පදනම කවරේද;

(iii) මෙම අරමුදල කළමනාකරණය කරනු ලබන ආකාරය කවරේද;

(iv) මෙම අරමුදලට මුදල් ලබාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙට්‍රල් ලීටරයකින් හා ඩීසල් ලීටරයකින් මාර්ග නඩත්තු භාර අරමුදලේ තැන්පත් කිරීමට ගිවිස ගන්නා ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අනුව එම අරමුදලේ තැන්පත් කිරීමට 2006, 2007, 2008 වර්ෂ සඳහා එකතු කරන ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාර්ග නඩත්තු වෙනුවෙන්, ඉහත වර්ෂ සඳහා අය වැය ලේඛනයෙන් වෙන් කරනු ලැබූ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මාර්ග නඩත්තු භාර අරමුදලෙන් ඉහත සඳහන් වර්ෂවලදී මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට මුදාහල සම්පූර්ණ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන්කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1133/'08

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ එකොළහ තුළදී විශේෂ මාර්ග ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු වෙනුවෙන් පමණක් ගෙවීමට රජයේ ඒකාබද්ධ අරමුදලෙන් සහ වෙනත් සැපයුම් මූලයන් වෙතින් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ලබාගෙන ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මෙලෙස සුවිශාල වශයෙන් ලබාගන්නා මුදල් වංචාවකින් සහ දූෂණයකින් තොරව අවතැන්වූ හෝ පීඩාවට පත්වූවන් වෙත ලැබෙන්නේදැයි නිරීක්ෂණය කිරීම සඳහාත්, අත්පත් කර ගැනීමේ කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහාත් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට පළපුරුදු නිලධාරීන්ගෙන් සමන්විත විමර්ශන ඒකකයක් තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ සේවා පළපුරුද්ද වර්ෂ කොපමණද;

(iii) නොඑසේ නම්, එවැනි විමර්ශන ඒකකයක් පිහිටුවීම සඳහා කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iv) අවතැන්වූ හෝ පීඩාවට පත්වූවන් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1160/'08

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පානීය ජලය සපයන මහවැලි සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයට අයත් සූරියවැව වැව් රක්ෂිතයේ සිටින අනවසර පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම අනවසර පදිංචිකරුවන්ගෙන්, ජලාශයට එක්වන අපද්‍රව්‍ය නිසා පානීය ජලය ලබා ගන්නා ජලාශය අපිරිසිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන්ගේ නම, ලිපිනය, පවුලේ සාමාජික සංඛ්‍යාව සහ මේ දක්වා ඔවුන් අනවසරයෙන් පදිංචිවී සිටි කාලය, එක් එක් පවුලට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වීරවිල ගුවන් තොටුපල තැනීමේදී ඉඩම් අහිමිවන අයට දීමට නියමිතව තිබූ මහවැලි අධිකාරියේ ඉඩම් කට්ටි, අදාළ ගුවන් තොටුපල එම ස්ථානයේ ඉදිකරනු නොලබන බැවින් වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන්ට එකී ඉඩම් ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, ඔවුන්ට වාරි ඉඩම් සහ පදිංචියට ගොඩ ඉඩම් ලබා දෙන ස්ථානය සහ අදාළ වාරි සහ ගොඩ ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) දීර්ඝ කාලයක් අනවසර පදිංචිකරුවන් විසින් උපයාගත් දේපල ඔවුන් ඉවත් කිරීමේදී අහිමිවන නිසා, වාණිජ වටිනාකම පදනම් කරගෙන වන්දි ගෙවීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1173/'09

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, නාගොඩ, පරණතානායම්ගොඩ කණිටු විද්‍යාලය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) මෙම පාසලට අයත් භූමිය පරිත්‍යාග කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) මෙම පාසල වසා දමා කොපමණ කාලයක් ගතවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු ආණ්ඩුකාරවරයෙකු වන එම්. එස්. අමරසිරි මහතා ඇතුළු විශාල උගතුන් පිරිසක් රටට දායාද කිරීමට මෙම පාසල මූලික වූ බවත්;

(ii) මෙම පාසල වසාදැමීම නිසා අඩු ආදායම්ලාභී දෙමව්පියන්ට අධික මුදලක් ගෙවා පාසල් වෑන් රථවලින් ආසන්න පාසල්වලට තම දරුවන් යැවීමට සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ගොඩනැගිලි ඇතුළු පහසුකම් සහිත මෙම පාසලට තම දරුවන් එවීමට දෙමව්පියන් සූදානම් බැවින්, අවශ්‍ය ගුරුවරුන් ලබාදී කොපමණ කාලයක් තුළ මෙම පාසල විවෘත කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1202/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මොටර් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතුරින් ඩීසල් වාහන සහ පෙට්‍රල් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලියාපදිංචි මුළු පෙට්‍රල් වාහන අතුරින් යතුරුපැදි, ත්‍රීරෝද රථ සහ වෙනත් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සම්පූර්ණ පෙට්‍රල් අලෙවියෙන් , යතුරු පැදි සහ ත්‍රීරෝද රථ සඳහා කවර ප්‍රතිශතයක් අලෙවි වන්නේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) පෙට්‍රල් මිල අඛණ්ඩව ඩීසල් මිලට වඩා වැඩි අගයක් ගැනීම හේතුවෙන් ත්‍රීරෝද රථ සහ යතුරුපැදිවල ගමන් ගන්නා මගීන් දැඩි අපහසුතාවයකට පත්වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2009 ජුනි මස 09 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1220/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සිමෙන්ති කොට්ටයක් කර්මාන්ත ශාලාවෙන් නිකුත් කරන ලද මිල කොපමණද;

(ii) එක් එක් සිමෙන්ති කර්මාන්ත ශාලාවෙන් දිනකට නිකුත් කරන ලද සිමෙන්ති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රමාණය වෙළෙඳපොලට ප්‍රමාණවත් වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අප රටේ සිමෙන්ති නිෂ්පාදනය ඉහළ නැංවීමට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1222/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පුල්මුඩේ ප්‍රදේශයේ ඛනිජ වැලි නිධියක් පිහිටා තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඛනිජවැලි නිධිය තුළ තිබෙන ඛනිජ වර්ග කවරේද;

(ii) එම ඛනිජ නිධිය සම්බන්ධයෙන් විදේශ සමාගමක් සමඟ ගිවිසුමකට එළැඹීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත්කර තිබේද;

(iii) එසේනම් ඒ කවදාද;

(iv) ඒ සඳහා අදාළ අනුමැතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ගිවිසුම අත්සන් කිරීමට අපේක්ෂිත විදේශ සමාගමේ නම හා ලිපිනය කවරේද;

(ii) එම සමාගම සමඟ මේ වන විට ගිවිසුම අත්සන්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1223/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "මහින්ද චින්තනය" නමින් ප්‍රතිපත්ති ප්‍රකාශයක් නිකුත්කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) "මහින්ද චින්තනය" නමැති මුද්‍රිත ප්‍රකාශනය තුළ අන්තර්ගත යෝජනා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් මේවන විට ක්‍රියාත්මක කර තිබෙන යෝජනා සංඛ්‍යාව කොපමණද;

(iii) ඉතිරි යෝජනා ක්‍රියාත්මක කිරීමට කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1229/'09

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

